**<u>කලාකරු හැඳුනුම්පතක් ලබා ගැනීමේ ක්‍රමවේදය පිළිවෙලින්</u>**

1. කලාකරු හැඳුනුම්පත ලබා ගැනීම සඳහා වූ අයදුම්පත්‍රය අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල/දිස්ත්‍රික් ලේකම් කාර්යාල /සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත පැමිණ හෝ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් බාගත කල හැකිය.
2. අයදුම්පතෙන් විමසා ඇති තොරතුරු නිවැරදිව සටහන් කල යුතු අතර පහත කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කල යුතු වේ.
    - නම ලිපිනය සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් නිවැරදිව සටහන් කල යුතුයි.
    - දෙමල මාධ්‍ය අයදුම්කරුවන් සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රිතව ඇති අයදුම්පත භාවිත කල හැකි අතර නම ලිපිනය ඉංග්‍රීසි මාධ්‍යයෙන් සඳහන් කිරිම අනිවාර්යය වේ.
    - ජාතික හැඳුනුම්පත් අංකය, ඔබ අයත් කලා මාධ්‍ය නිවැරදිව සටහන් කල යුතුයි.
3. ඉල්ලුම්කරුගේ අත්සන, නිර්දේශ අංක 01 සඳහා වූ සංස්කෘතික බලමණ්ඩල සභාපති අත්සන, නිර්දේශ අංක 02 සඳහා වූ සංස්කෘතික නිලධාරි /සංවර්ධන නිලධාරි /සංවර්ධන සහකාර අත්සන ,දිස්ත්‍රික් ලේකම් /ප්‍රාදේශීය ලේකම් අනුමැතිය අනිවාර්යය වේ.
4. ඉල්ලුම්කරුගේ පැහැදිලි ඡායාරූප 02 ක් ඉදිරිපත් කල යුතු වේ.
5. ඉල්ලුම්කරු කලාකරුවකු බවට ඔප්පු කිරිමට පවතින ලියකියවිලි වල පිටපත් ඇමිණිය යුතුයි.
6. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු සංස්කෘතික නිලධාරී විසින් අදාල නිර්දේශයන් ලබා ගෙන සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ඇත .
7. පලමුවර නිකුත් කරන හැඳුනුම්පත නොමිලේ නිකුත් කරන අතර නැවත ලබා ගැනීමක් සිදු කරන්නේ නම් පහත සඳහන් කරුණු සම්පූර්ණ විය යුතුයි.
    - සංශෝධිත අයදුම්පත්‍ර සඳහා ද ප්‍රාදේශීය ලේකම් නිර්දේශය අවශ්‍ය වේ.
    - සංශෝධනය කිරීමක් හෝ අස්ථානගත වීමක් සඳහා රු . .250/- ක් ගෙවිය යුතුයි.
    - සංශෝධනය සඳහා පැරණි හැඳුනුම්පත භාරදීම අනිවාර්යය වේ.
    - අස්ථානගත වීමක් නම් පොලිස් වාර්තාවක් ඉදිරිපත් කල යුතුයි.
8. අලුතින් හැඳුනුම්පතක් ලබා ගන්නේ නම් අංක 01 සිට 06 දක්වා කරුණු සම්පූර්ණ වී ඇත්නම් පරික්ෂා කර බලා සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු කලාකරු හැඳුනුම්පතක් නිකුත් කල හැකි වේ.